# නිරන්තරයෙන් අසනු ලබන ප්‍රශ්න  (FAQ`s)

**පොදු**

1. මා ලියාපදිංචි  විය යුත්තේ ඇයි ?

ආරක්ෂක හමුදාව විසින් හෝ පොලිස් නිලධාරින් විසින්  SIM පතේ (පාර්භෝගිකයන් හදුනා ගැනීමේ මොඩියුලය ) හිමිකාරත්වය සනාථ කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක එය ඉටු කිරීම සඳහා  ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ( TRCSL ) නියමයන්ට අනුකූලව  සියලුම ජංගම දුරකතන පාර්භෝගිකයන් ඔවුන්ගේ අදාළ ජංගම දුරකතන ජාලයන් යටතේ ලියාපදිංචි විය යුතු වෙයි .

2. ලියාපදිංචිය/ නැවත ලියාපදිංචිය සඳහා මා විසින් ගාස්තුවක් ගෙවිය යුතු ද ?

නැත

**පිළිවෙත**

3. ලියාපදිංචිය / නැවත ලියාපදිංචිය සඳහා  මාවිසින් රැගෙන ආ යුත්තේ මොනවා ද ?

- අ )	ජාතික හැඳුනුම්පත / වලංගු  විදේශ ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍රය
- ආ)	ඕනෑම මොබිටෙල් මධ්‍යස්ථානයක දී ජායාරූපයක් (සෙ.මී.3.5 X සෙ.මී.4.5 ) ලබා ගැනීමේ පහසුකම සලසා ඇත.  නැතහොත් ඔබගේ  මෑතකදී ගන්නා ලද පාස්පෝට් වර්ණ ජායාරූපයක්
- (ඇ)	පෙර ගෙවුම් හා පසු ගෙවුම් සාමාන්‍ය ඇමතුම් හෝ බ්‍රෝඩ් බෑන්ඩ් සබඳතාවයක් ලබා ගන්නේ නම් පමණක් ලිපිනය සනාථ කල හැකි  බිල්පත් වල පිටපතක්
- (ඈ)	සමාගමක් යටතේ ලබා ගන්නා ලද සම්බන්ධතාවයක් නම්  සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සහ සමාගමෙන් ලබා ගන්නා ලද ලිපියක්.

ඔබට දැනටමත් මොබිටෙල් සම්බන්ධතාවයක් හිමිනම් පහත ලියවිලි ඉදිරිපත් කරන්න.

- i	ලියාපදිංචි කළ යුතු SIM පත. ( හෝ SIMපත් )
- ii	ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍රය .
- iii	මෑතක දී ගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ (සෙ.මී.3.5xසෙ.මී.4.5) වර්ණ ජායාරූපයක් .
- iv	පෙර ගෙවුම් හා පසු ගෙවුම් සාමාන්‍ය ඇමතුම් හෝ බ්‍රෝඩ් බෑන්ඩ් සබඳතාවයක් ලබා ගන්නේ නම් පමණක් ලිපිනය සනාථ කල හැකි  බිල්පත් වල පිටපතක්.
- v	සමාගමක් යටතේ ලබා ගන්නා ලද සම්බන්ධතාවයක් නම්  සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සහ සමාගමෙන් ලබා ගන්නා ලද ලිපියක් .

**සටහන:**

ඔබ තවම ජාතික හැඳුනුම්පතක් ලබා නොමැති නම් ඔබේ දෙමාපියන් / භාරකරු සමග පැමිණ අදාළ ඉහත සඳහන් ලේඛණ ඉදිරිපත් කරන්න.

ඉහත (ආ) / iii සදහන් අයුරින් ඔබ සතු ඡායාරූපයක් නොමැත්තේ නම් අපගේ මධ්‍යස්ථාන වල දී ගාස්තුවකින් තොරව ඔබගේ ඡායාරූපයක් ගත හැකිය .

4. මට ලියාපදිංචි විය හැක්කේ කුමන ස්ථානයකින් ද ?

පහත සඳහන් මධ්‍යස්ථාන වලදී සියළුම නව සහ දැනටමත් මොබිටෙල් සම්බන්ධතාවයක් හිමි පාරිභෝගිකයන් හට ලියාපදිංචිය නැවත ලියාපදිංචිය සිදු කළ හැක.

- මොබිටෙල් ශාඛා
- ශ්‍රී ලංකා ටෙලිකොම් ටෙලිෂොප් ශාඛා
- ශ්‍රී ලංකා ටෙලිකොම් ප්‍රාදේශීය කාර්යාල
- සිංගර් මෙගා
- තෝරාගත් මොබිටෙල් බලයලත් නියෝජිත වෙළඳ සැල්
- ආර්පිකෝ සුපර් සෙන්ටර් හයිඩ්පාක් කෝනර්

05. මා ලියාපදිංචි වූ පසු ඒ බව මට දැනුම් දෙන්නේ ද ?

ඔව්. ලියාපදිංචිය සාර්ථක වු පසු ඒ බව SMS මාර්ගයෙන් ඔබට දැනුම් දෙනු ඇත.

06. ලියාපදිංචියට පසු මට හැඳුනුම් සහකිතපතක් හිමි වේ ද?

ඔව්. තාවකාලික මොබිටෙල් හැඳුනුම් සහතිකපතක් ( MIC) ඔබට ලැබෙන අතර පසුව අප විසින් ඔබගේ ස්ථිර ලිපිනය වෙත මොබිටෙල් ස්ථිර හඳුනාගැනීමේ සහතිකය එවනු ලැබේ .

07. මගේ SIM පතට අදාළ මොබිටෙල් ඩිජිටල් සහතිකය ( MDC ) ලබා ගන්නේ කෙසේ ද ?

#132# යොදා SEND කරන්න. එවිට ඔබට ඔබේ;

- මොබිටෙල් අංකය:
- නම:
- ජාතික හැඳුනුම්පත් අංකය:
- SIM අංකය:

ජංගම දුරකතන තිරයේ දිස්වනු ඇත

**වෙනත් කරුණු**

08. මගේ ජාතික හැඳුනුම් පතේ / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ / මෙරට රියදුරු බලපත්‍රයේ සඳහන් ලිපිනය දැනට පදිංචි ස්ථිර ලිපිනයට වඩා වෙනස් නම්

ගැටළුවක් නොවේ . ඔබේ SIM පත ඔබ දැනට පදිංචිව සිටින ලිපිනය යටතේ ලියාපදිංචි කළ හැකිය

09. මම ශ්‍රී ලාංකිකයෙකු නොවෙමි . මා ලියාපදිංචි විය යුතු ද ?

ඔව්. ඔබට ඉහත අංක 3 යටතේ සඳහන් පිළිවෙලම අනුගමනව කරමින් ලියාපදිංචි විය යුතුය

10. මා වෙනත් තැනකින් මිල දී ගත් SIM පතක් ලියාපදිංචි කිරීම කළ හැක්කේ කෙසේ ද ?

ඔබට ඉහත අංක 4 සඳහන් ඕනෑම ස්ථානයකින් ලියාපදිංචි විය හැකිය .

11. මා වෙනුවෙන් මාගේ SIM පත ලියාපදිංචි කිරීම වෙනත් අයෙකුට පැවරිය හැකි ද ?

නොහැකිය. ඔබගේ හිමිකාරත්වය තහවුරු කිරීම සඳහා ඔබටම පැමිණිමට සිදු වේ .

12. මාගේ මොබිටෙල් සම්බන්ධතාවය යටතේ දුරකතන කිහිපයක් ඇත. මට ඒ සියල්ල ලියාපදිංචි කිරීමට සිදු වේ ද ?

ඔබගේ නම යටතේ දුරකතන අංක කිහිපයකට අදාළ SIM පත් ලියාපදිංචි කර ඇත්තේ නම් ඔබ ඒ සියල්ලම එකවිට භාවිතා නොකරනවා විය හැක. එම SIM පත් අනෙක් අය විසින් භාවිතා කරන්නේ නම්, ඔවුන්ගේ නම් යටතේ ඒවා ලියාපදිංචි කරන ලෙස ඔබ ඔවුන්ට දන්වා සිටිය යුතුය. කෙසේ වුව ද ඔබ යම් අවශ්‍යතාවයක් වෙනුවෙන් එක් SIM පතකට වඩා භාවිතා කරන්නේ නම් ඒවා වෙන් වෙන්ව ලියාපදිංචි කිරීම අනිවාර්යය වෙයි .

13. මම මේ වන විටත් වෙනත් ජාලයක් යටතේ ලියාපදිංචි වී ඇත්තෙමි. මොබිටෙල් සම්බන්ධතාවය සඳහා මා මොබිටෙල් ජාලය යටතේත් ලියාපදිංචි විය යුතු ද ?

ඔව්. මොබිටෙල් සම්බන්ධතාවය සඳහා මොබිටෙල් ජාලය යටතේත් ලියාපදිංචි විය යුතුය .

14. මගේ ලියාපදිංචි කළ SIM පත නැති විය. මගේ නව SIM පත නැවත ලියාපදිංචි කිරීමට අවශ්‍ය ද ?

නැත. ඔබ විසින් පෙර දී ලියාපදිංචි කළ අංකයමට නව SIM පත ලියාපදිංචි කලේ නම් එම තොරතුරු මොබිටෙල් තොරතුරු පද්ධතියේ ඇතුළත් වී ඇති බැවින් නැවත ලියාපදිංචිය අනවශ්‍යය. නමුත් මොබිටෙල් හැදුනුම්පත් සහතිකයක් නැවත ලබා ගත යුතුය .

### ඔබ ලියාපදිංචි නොවුවහොත්…

විදුලි සංදේශ නියාමන කොමිෂම විසින් නිකුත් කළ රෙගුලාසි අනුම සැම ජංගම දුරකතන පාර්භෝගිකයෙකුම ලියාපදිංචි වීම අනිවාර්ය වේ.